# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,809 - 2013 මැයි මස 03 වැනි සිකුරාදා - 2013.05.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 652 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 653 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 656 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 658 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මුදල් පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි ස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - මාරවිල**

අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මාරවිල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2013.06.01 වැනි සෙනසුරාදා පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින එය ආරම්භ කිරීමට පැයකට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

අදාළ භාණ්ඩ සඳහා ලන්සු තැබීමට අපේක්ෂා කරනු ලබන අයට අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි, එම ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා චෙක්පත් හෝ මුදල් ඇනවුම් භාරනොගන්නා බැවින් එකී අවස්ථාවේ දී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතු අතර, එදින ප. ව. 4.00 ට පෙර මිල දී ගනු ලබන භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

සී. එච්. ජී. ලියනගේ,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මාරවිල.

2013 අප්‍රේල් මස 09 වැනි දින,
මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | ඒ 342/06 | අංක 118-9188 ය/පැදිය |
| 02. | ඒ. 1255/09 | අංකය නොමැති එන්ජින් අංක C 70 E - 1012803 ය/පැදිය |
| 03. | ඒ 1960/09 | අංක 117-5008 ය/පැදිය |
| 04. | ඒ 1190/10 | අංක NWTT 4255 ය/පැදිය |
| 05. | ඒ 24/11 | අංකය නොමැති එන්ජින් අංක 23160 FMG 02110947 ය/පැදිය |
| 06. | ඒ 115/11 | අංකය නොමැති එන්ජින් අංක V 80-5331070 ය/පැදිය |
| 07. | ඒ 920/11 | අංක GK - 8948 දරන ය/පැදිය |
| 08. | ඒආර් 1078/11 | අංක 128-5669 ය/පැදිය |
| 09. | ඒආර් 1079/11 | අංකය නොමැති චැසි අංක FSB - 803011 දරන යමහා ය/පැදිය |
| 10. | ඒආර් 125/12 | අංකය නොමැති එන්ජින් අංක DX 125 AE -010488 දරන ය/පැදිය |
| 11. | ඒආර් 134/12 | අංකය නොමැති එන්ජින් අංක 171234 දරන ය/පැදිය |
| 12. | ඒආර් 137/12 | අංකය නොමැති එන්ජින් අංක DDMBHF 91211 දරන ය/පැදිය |
| 13. | ඒආර් 540/12 | අංක NWWC - 0936 ය/පැදිය |
| 14. | ඒආර් 866/12 | අංකය නොමැති එන්ජින් අංක AA01E 1191427 ය/පැදිය |
| 15. | ඒආර් 867/12 | අංක 153-6315 දරන ය/පැදිය |
| 16. | ඒආර් 868/12 | අංක 102 ශ්‍රී 3762 ය/පැදිය |
| 17. | ඒආර් 869/12 | අංක NW MB 8051 ය/පැදිය |
| 18. | ඒආර් 886/12 | අංක NW VV 3159 ය/පැදිය |
| 19. | ඒආර් 883/12 | අංක NWVI 4625 ය/පැදිය |
| 20. | 7556/සී | අංකය නොමැති එන්ජින් අංක HS147 FMF - A 03012197 ය/පැදිය |
| 21. | 54486 | අංක NWHY 8802 ය/පැදිය |
| 22. | 61605 | අංක NWTZ 9174 ය/පැදිය |
| 23. | ඒ 1002/11 | පා පැදි 01යි |
| 24. | ඒ 624/10 | පා පැදි 02යි |
| 25. | ඒ 1360/10 | පා පැදි 01යි |
| 26. | ඒ 136/12 | පා පැදි 01යි |
| 27. | ඒ 872/12 | පා පැදි 01යි |
| 28. | ඒ 67/10 | පා පැදි 01යි |
| 29. | ඒ 135/12 | පා පැදි 01යි |
| 30. | ඒ 1432/12 | පා පැදි 01යි |
| 31. | ඒ 872/12 | පා පැදි 01යි |
| 32. | ඒ 1478/12 | පා පැදි 01යි |
| 33. | ඒ 1675/09 | පා පැදි 01යි |
| 34. | ඒ 96/12 | පා පැදි 01යි |
| 35. | ඒ 1965/09 | පා පැදි 01යි |
| 36. | ඒ 873/12 | පා පැදි 01යි |
| 37. | ඒ 802/10 | පා පැදි 01යි |
| 38. | ඒ 67/10 | පා පැදි 01යි |
| 39. | ඒ 944/10 | පා පැදි 01යි |
| 40. | ඒ 846/10 | පා පැදි 01යි |
| 41. | ඒ 800/10 | පා පැදි 01යි |
| 42. | ඒ 1728/09 | පා පැදි 01යි |
| 43. | ඒ 653/10 | පා පැදි 01යි |
| 44. | ඒ 1076/11 | පා පැදි 01යි |
| 45. | ඒ 1742/12 | පා පැදි 02යි |
| 46. | ඒ 142/12 | පා පැදි 01යි |
| 47. | ඒ 1742/12 | පා පැදි 01යි |
| 48. | ඒ 1228/11 | පා පැදි 01යි |
| 49. | ඒ 787/04 | පා පැදි 01යි |
| 50. | ඒ 1654/12 | පා පැදි 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 51. | ඒ 1653/12 | පා පැදි 01යි |
| 52. | ඒ 917/12 | පා පැදි 01යි |
| 53. | ඒ 127/12 | පා පැදි 01යි |
| 54. | ඒආර් 951 | නිල් මැරින් බෝට්ටු 01යි |
| 55. | ඒආර් 953/10 | නිල් මැරින් බෝට්ටු 01යි |
| 56. | 36348 | ගෑස් සිලින්ඩර් 01යි |
| 57. | ඒ 1486/11 | ගෑස් සිලින්ඩර් 01යි |
| 58. | ඒ 897/11 | ගෑස් සිලින්ඩර් 01යි |
| 59. | ඒ 868/12 | ගෑස් සිලින්ඩර් 01යි |
| 60. | 73138 | ගෑස් සිලින්ඩර් 01යි |
| 61. | ඒ 1311/10 | සවල් 02යි |
| 62. | ඒ 1338/10 | සවල් 01යි |
| 63. | ඒ 966/10 | සවල් 01යි |
| 64. | ඒ 1225/10 | සවල් 01යි |
| 65. | ඒ 117/11 | සවල් 01යි |
| 66. | ඒ 819/11 | සවල් 01යි |
| 67. | ඒ 626/10 | සවල් 01යි |
| 68. | ඒ 645/10 | සවල් 03යි |
| 69. | 65508 | සවල් 02යි |
| 70. | ඒ 1503/11 | උදළු 02යි |
| 71. | ඒ 1312/10 | උදළු 01යි |
| 72. | ඒ 900/10 | උදළු 01යි |
| 73. | ඒ 117/11 | උදළු 01යි |
| 74. | ඒ 645/10 | උදළු 01යි |
| 75. | අංක 669107 | ෆිසිට් සිංහල අබලන් ය/ලියන 01යි |
| 76. | අංක 9403987 | ඔලිවෙට්ටි සිංහල අබලන් ය/ලියන 01යි |
| 77. | අංක 488087 | ඔප්ටිමා සිංහල අබලන් ය/ලියන 01යි |
| 78. | අංක 785952 | ඔප්ටිමා ඉංග්‍රීසි අබලන් ය/ලියන 01යි |
| 79. | අංක 140665 | ඔප්ටිමා සිංහල අබලන් ය/ලියන 01යි |
| 80. | අංක 453054 | ඔප්ටිමා සිංහල අබලන් ය/ලියන 01යි |
| 81. | බැරල් තොගයක් (ප්ලාස්ටික් හා යකඩ) | |
| 82. | කෑන් තොගයක් | |
| 83. | වීදුරු බෝතල් තොගයක්. | |

05-30

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය**

2013 ජූලි මස සිට 2014 ජුනි මස දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

2013 ජූලි මස 01 වැනි දින සිට 2014 ජුනි මස 30 වැනි දින දක්වා මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 2007 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ............................... දරන ............................... රා තැබෑරුම සඳහා" යනුවෙන් හා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2013.05.20 වැනි දින පෙ. ව. 10.00 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 2007 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2013.05.20 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2013.06.04 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. පී. රංගන ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2013 අප්‍රේල් මස 10 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය,
කල්පිටිය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම* | *ටෙන්ඩර් පත්‍රය භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2013.05.20 වැනි දින පෙ. ව. 10.00 | 1,000. 00 |
| 02. | කල්පිටිය | ඒත්තාල | රා | 2013.05.20 වැනි දින පෙ. ව. 10.00 | 1,000. 00 |

05-44

---

2013 අප්‍රේල් මස 16 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
පුත්තලම.

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2013/2014 වර්ෂය

**2013 ජූලි මස 01 සිට 2014 ජුනි මස 30 දක්වා**

2013 ජූලි මස 01 දින සිට 2014 ජුනි මස 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ''අංක.......................... දරන................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2013.05.17 දින පෙ.ව.10.00 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2013.05.17 දින පෙ.ව.10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. ආර්. එම්. මලික්,
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2013ක් වූ අප්‍රේල් මස 16 වැනි දින.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01 | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සේනකුඩිරිප්පුව | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>රාත්‍රී 8.00 | 2013.05.17<br>පෙ.ව. 10.00 | 1,000 |

05-45

---

**නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2013 ජූලි මස 01 වැනි දින සිට 2014 ජුනි 30 වැනි දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2013 ජූලි මස 01 වැනි දින සිට 2014 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් රේන්ද විකිණීම සඳහා වූ ටෙන්ඩර් 2013.05.23 වැනි දින පෙ. ව. 10.00 දක්වා ම' විසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, නියමිත ඇප තැන්පත් කුවිතාන්සියක් ද, අදාල ටෙන්ඩරයේ සඳහන් මිලෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරේ "අංක 01 මුදුකටුව රා තැබෑරුම" හෝ "අංක 02 කටුනේරිය රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2013.05.23 වැනි දින පෙ.ව. 10.00 ට පෙර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද විකිණීමේ කොන්දේසි වලට අනුකූල විය යුතුය.

05. 2013 මැයි මස 23 වැනි දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2013.06.07 වැනි දින පෙ.ව. 10.00 ට සිදුකරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එන්. ඒ. ඒ. පී. එස්. නිස්සංක,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2013 අප්‍රේල් මස 10 වැනි දින,
ප්‍රදේශීය ලේකම් කාර්යාලය,
නාත්තන්ඩිය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| 01. | නාත්තන්ඩිය | මූදුකටුව | 1,000 |
| 02. | නාත්තන්ඩිය | කටුනේරිය | 1,000 |

05-20

# රජයේ නොවන දැන්වීම්

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීම

සමාගම් නාමය : නෙක්ස්ගෘප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 91655
ලියාපදිංචි කළ දිනය : 2013.03.21
කාර්යාල ලිපිනය : අංක 154, කමතවත්ත පාර, රාජගිරිය.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

05-07

---

**සී/ස සැම්සන් ස්පෝට්ස්වෙයා (පුද්ගලික) සමාගම (සමාගම් අංක පීවී 379) හා සී/ස ඩී සැම්සන් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධ කිරීමයි (සමාගම් අංක පීවී 380)**

සී/ස සැම්සන් ස්පෝට්ස්වෙයා (පුද්ගලික) සමාගම සී/ස ඩී සැම්සන් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම සමග ඒකාබද්ධ වී ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙන්නෙමු. ඒ අනුව සී/ස ඩී සැම්සන් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධිත සමාගම වන්නේ ය. ඒකාබද්ධවීම බලාත්මක වන්නේ 2013 අප්‍රේල් මස 1 වැනි දා සිටය. ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි ලිපිනය අංක 110 කුමාරන් රත්නම් පාර, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ඩී සැම්සන් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

05-80

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නාමය : ඕපන්ලින්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 91583
සංස්ථාගත කළ දිනය : 2013 මාර්තු 18
ලියාපදිංචි ලිපිනය : එල්/ජී/1, කොස්වත්ත පාර, ඇල්විටිගල මාවත, කොළඹ 08

මනෝරි ප්‍රියංකා වීරසේකර,
අධ්‍යක්ෂක.

05-79

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු

ලියාපදිංචි සමාගමේ නම : තමානියා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 91950
ලියාපදිංචි කළ දිනය : 2013.04.05
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 88, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-77

## සමාගම් සංස්ථාපන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තියට අනුව අප සමාගමේ සංස්ථාපනයට අදාළ තොරතුරු මහජනතාවගේ දැනගැනීම පිණිස පළ කෙරේ.

සමාගමේ නම : සෙන්ට්‍රල් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 72050
දිනය : 2010.04.26
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 171, ගනේහේන, කඩුවෙල පාර, බත්තරමුල්ල.

සෙන්ට්‍රල් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 171, ගනේහේන, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

05-13

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2013 මාර්තු මස 28 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : කොන්ඩොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91784
ලිපිනය : අංක 38, ගොල් ෆේස් කෝට් 02, කොළඹ 03

මණ්ඩලයේ අණ පරිදි,

මායිදාස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 අප්‍රේල් මස 10 වැනි දින.

05-57

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

දැනට 6390, Briarcliffe Dr, Belleville, MI, 48111, U. S. A. සහ කලින් විතාරන්දෙනිය, දෙමටවල පදිංචි ඩැනිස්ටර් අබේගුණවර්ධන වන මා විසින් ගම්පහ, උසාවිය පාරේ, අංක 72 දරන තැන පදිංචි ප්‍රසාද් චේකනාත රන්නුලු (ජා. හැ. ප. අංක 6623000179 V ) යන අය වෙත ප්‍රදානය කරන ලද ඇමරිකාවේ මිචිගන් ජනපදයේ ප්‍රසිද්ධ නොතාරිස් Pamela K. Giles විසින් සහතික කරන ලද වර්ෂ 2005 ජූලි 23 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු කර අහෝසි වන අතර එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ඩැනිස්ටර් අබේගුණවර්ධන.

2013 අප්‍රේල් මස 04 වැනි දින.

05-22

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සංස්ථාපිත දිනය : 2007.08.21
සමාගමේ නම : ඩෙන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 61069
ලියාපදිංචි කාර්යාලය : අංක 104/26, කිව් පාර, කොළඹ 02.

සමාගමේ ලේකම්.

05-54

---

## යුනිවර්සල් හෝල්ඩිංග්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 334 වගන්තිය ප්‍රකාරව වූ දැන්වීමයි

සමාගමේ ණය හිමියන්ගේ රැස්වීමක් 2013 මැයි මස 28 වැනි දින පෙ. ව. 11.30 ට කොළඹ 02, නවම් මාවත, අදියර 2සී, "වැලියන් ටවර්ස්" දරන ස්ථානයේ දී පැවැත්වෙන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 334 වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2013 අප්‍රේල් මස 17 වැනි දින.

05-27

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඩෙන්මාර්ක්, හර්නින් ප්‍රොරොස්කෝපාකන් අංක 69.7400 හි පදිංචි ජා. හැ. අංක 687611527 V හිමි ගව්රි රුද්‍රාතීසන් වන මම වර්ෂ 2011.07.21 වැනි දින ඩෙන්මාර්ක් ප්‍රසිද්ධ නොතාරිස් කර්නි නිෂාන් විසින් ලියා අත්සන් කළ සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ 2011.08.04 වැනි දින 7260 දින පොතේ ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රයෙන් කොළඹ 13, කොටහේන, ගුණානන්ද මාවත, අංක 120 හි පදිංචි සහ ජා. හැ. අංක 522412198 Vහිමි සනා රාජපක්ෂ හට දෙන ලද ඇටෝර්නි බලය 2013.04.15 වැනි දින සිට අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ගව්රි රුද්‍රාතීසන්.

05-55

**CHEMANEX ADHESIVES (PRIVATE) LIMITED**

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)
සමාගම් ලියාපදිංචි අංකය පී වී 3701

**අවසන් මහ සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 331(2) වගන්තිය යටතේ සෑහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහ සභා රැස්වීම 2013 ජූනි මස 11 වැනි දින පස්වරු 4.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි පිහිටි එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් ආයතනයේ රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඇවරකිරීමේ කටයුතු සිදුකල ආකාරය
2. සමාගමේ වත්කම් උපලබ්ධි කල ආකාරය සහ
3. අදාල අනෙකුත් විස්තර ලබාදීම සම්බන්ධයෙන්

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
Chemanex Adhesives (Private) Limited
ඇවරකරුවන්.

2013 අප්‍රේල් මස 17 වැනි දින.

05-23

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (2) වගන්තිය ප්‍රකාරව මහජනයා වෙත කෙරෙන නිවේදනයයි.

සමාගමේ නම : ඇරෝමා ලේටෙක්ස් (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 88489
සංස්ථාගතකළ දිනය : 2012.09.26
ලියාපදිංචි කාර්යාලය : නුංගමුව, මාවනැල්ල.

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (2) වගන්තිය ප්‍රකාරව මහජනයා වෙත කෙරෙන නිවේදනයයි.

සමාගමේ නම : ෂීසන්ස් වර්ල්ඩ්වයිඩ් (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 90764
සංස්ථාගතකළ දිනය : 2013.01.30
ලියාපදිංචි කාර්යාලය : අංක 24/1ඒ, කෑගල්ල පාර, රඹුක්කන

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (2) වගන්තිය ප්‍රකාරව මහජනයා වෙත කෙරෙන නිවේදනයයි.

සමාගමේ නම : මැක්ස්ලයිෆ් ඇන්ඩ් ලයිෆ් කෙයාර් (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 90726
සංස්ථාගත කළ දිනය : 2013.01.29
ලියාපදිංචි කාර්යාලය : අංක 199, ගැවිලිපිටිය, අරනායක.

සමාගම් ලේකම්.

05-58

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැන්ක් පීඑල්සී - පියස සෙන්ටර් ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දෙහිවල ගල්කිස්ස නගර සභා සීමාවන් තුළ බොරුපන ගමේ නව සමගි මාවතේ පිහිටි වරිපනම් අංක 43/32 දරන බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට බලයලත් මානක ටී. එස්. සිරිවර්ධන විසින් සාදන ලද 1994.11.27 වැනි දින අංක 1274 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ප්‍රමාණය : පර්චස් 10.25

මෙම දේපළ, රත්මලාන පදිංචි හේවාසිලියනගේ ලිත් චන්දන රජීව් ද සිල්වා යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* ගාලු පාරේ ගොලුමඩම හන්දියෙන් බොරුපණ පාරේ ගමන් ගෙන වම්පසින් පිහිටි 9 වැනි පටුමගට හැරී සෙන්ටර් රෝඩ් දක්වා (Centre Road) ගමන් කරන්න. පසුව මෙම පාරේ ගමන් ගෙන වම්පසින් පිහිටි 10 වන පටුමගට හැරී ස්වල්ප දුරක් ගමන් ගත් විට නව සමගි මාවත හමුවේ. මෙම මාවතේ ස්වල්ප දුරක් ගිය විට වම් දෙසින් පිහිටි 1 වන පටුමගට හැරී මීටර් 50ක් පමණ ගිය පසු මෙම පටුමගේ වම් දෙසින් අදාල දේපළ පිහිටා තිබේ. (ව. අ. 43/32 නව සමගි මාවත)

2013 ක් වූ මැයි මස 27 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.05.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2008.05.16 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ 2008.05.15 දින වීරකේසරී බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,

6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න, ප්‍රධාන කළමණාකාරිනී (නීති), 14 වැනි මහල, සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456486, 011-2456473.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706.
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595

05-66

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මිනුවන්ගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා වගා කළ දේපළක් පන්නල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බඩබැද්ද ගමේ පිහිටි බඩබැද්දවත්ත නමැති ඉඩමට බලයලත් මානක නලින් වික්‍රමසිංහ විසින් 2011.11.20 වැනි දින සාදන ලද අංක 455/2011 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ඒකාබද්ධ ඉඩම් කොටස් තුනක් හා එහි පිහිටි පොල් හා තේක්ක වගාව ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අක්කර 13, රූ. 02, පර්. 24.20

*දේපළට පිවිසීම.-* පන්නල නගරයේ සිට මෙල්ලවගෙදර පාර ඔස්සේ මීටර් 650ක් පමණ ගමන් ගෙන දකුණු පසින් පිහිටි බොරලු/කොන්ක්‍රීට් කරන ලද පාරට හැරී එම පාරේ නුගගහ පසුකර මීටර් 50ක් පමණ ගමන් ගෙන දකුණට හැරී එම පාරේ කි. මී. 1.20ක් පමණ ගෙන ටී හන්දිය දක්වා ගමන් ගන්න. මෙහිදී දකුණට හැරී බොරළු පාරේ මීටර් 100ක් පමණ ගිය විට අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ කෙන්ට් පෝල්ට්‍රිෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා වාසල තන්ත්‍රිගේ දොන් ප්‍රේම් වසන්ත ජයසිංහ උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2013 ක් වූ මැයි මස 27 වැනි දින පෙ. ව. 9.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.03.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2013.04.02 වැනි දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකරන් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න, සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595, 071-4755974, 071-8446374 , 077-7761706

05-68

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මිනුවන්ගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා ගොඩනැගිලි සහිත ව්‍යාපාරික දේපළක් මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා මාබෝදල උප කාර්යාල සීමාවන් තුළ එස්සැල්ල ගමේ පිහිටි දුම්මලදෙනිය කැලේ නමැති ඉඩමට බලයලත් මානක එන්. වික්‍රමසිංහ විසින් 2010.09.20 වැනි දින අංක 209/2010 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි දෙමහල් ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අක්කර 05.

*දේපළට පිවිසීම.*- මීනුවන්ගොඩ නගරයේ සිට වේයන්ගොඩ පාරේ කි. මී. 06ක් පමණ නයිවල හන්දිය දක්වා ගමන්ගෙන වමට හැරී දිවුලපිටිය පාරට ඇතුළුවී කි. මී. 1.5ක් පමණ ගමන් ගෙන එස්සැල්ල පාරට හැරෙන්න. මෙම පාරේ කි. මී. 1.1ක් පමණ (හමුදා කඳවුර පසුකර) ගමන් ගෙන වම් පසින් හමුවන කොන්ක්‍රීට් පාරට ඇතුළු වී මීටර් 200ක් පමණ ගිය විට අදාල දේපළ දකුණු පසින් පිහිටා තිබේ.

මෙම දේපළ කෙන්ට් පෝල්ට්‍රි ෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා වාසල තන්ත්‍රිගේ දොන් ප්‍රේම් වසන්ත ජයසිංහ අධිකාරිගේ ප්‍රියානි මංගලිකා උකස්කරුවන් වශයෙන් ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2013 ක් වූ මැයි මස 27 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.03.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* 2013.04.02 වැනි දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරි (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595, 071-4755974, 071-8446374 , 077-7761706

05-67

**කොමර්ෂල් බැන්ක් පීඑල්සී - ගලේවෙල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තේගම යටවර ගමේ පිහිටි මෙල්වර්න් එස්ටේට් නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කැබලි දෙකක් හා එහි පිහිටි ගහකොළ වගාව ගොඩනැගිලි ඇතුළු සියලු දේ.

1. ඉහත කී ඉඩමට බලයලත් මානක කේ. එස්. සමරසිංහ විසින් 1987.01.06 වැනි දින සාදන ලද අංක 2974 දරන පිඹුරේ නිරූපිත ලොට් 02 නමැති ඉඩම් කොටස. ප්‍රමාණය අක්කර 01 පර්චස් 33

2. ඉහත කී ඉඩමට බලයලත් මානක එස්. විජේරත්න විසින් සාදන ලද 1989.03.19 වැනි අංක 558 දරන පිඹුරේ නිරූපිත ඒකාබද්ධ ලොට් 1 සහ ලොට් 2 නමැති ඉඩම් කොටස.

ප්‍රමාණය : රූඩ්. 02 පර්. 12.

*දේපලට පිවිසීම.*- වත්තේගම නගරයේ සිට මාතලේ දෙසට කි. මී. 3ක් පමණ ගමන් ගෙන වමට හැරී එම පාරේ පතන් පහ දුම්රිය මාර්ගය දක්වා ගමන් ගන්න. පසුව මෙම දුම්රිය මාර්ගයට සමාන්තරව පිහිටි මාර්ගයට ඇතුළු වී මහනුවර දෙසට මීටර් 50ක් පමණ ගිය විට මෙම පාරේ අවසානයේ පාරට මායිම්ව අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපල වත්තේගම, නුවර පාර, අංක 242 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන දුම්බර එන්ටප්‍රයිසස් (ලිමිටඩ්) බන්ධනදායි වශයෙන් හා නාදුගල සිරිවර්ධනලාගේ කණිෂ්ක සිරිවර්ධන උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2013 ක් වූ මැයි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට ද,

2 වැනි විකිණීම. - පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තේගම සුළු නගර සභා සීමාවේ වත්තේගම ගමේ පිහිටි සියඹලාගස්තැන්න වත්ත සහ වැලිජේලිය ලෙස දැන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. ඩී. පී. ගුණවර්ධන විසින් 2006.01.14 වැනි දින හා 18 වැනි දින සාදන ලද අංක 1391 දරන පිඹුරේ නිරූපිත ඒකාබද්ධ ලොට් 1 සහ ලොට් 3 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි වත්තේගම නුවර පාර වරිපනම් අංක 238 සහ 240 දරන ගොඩනැගිලි ඇතුලු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 20.48

දේපළට පිවිසීම. - වත්තේගම නගර මධ්‍යයේ සිට මහනුවර මාර්ගයේ මීටර් 750ක් පමණ ගමන් ගත් විට දුම්රිය හරස් පාර ආසන්නව පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2013ක් වූ මැයි මස 23 වැනි දින පෙ. ව. 10.45 ට ද එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දේපළ වත්තේගම නුවර පාර අංක 242 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන දුම්බර එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් හා මද්දුම වේරලාගේ කුසුමාවතී උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

යෝජනා සම්මුතිය සඳහා 2011.12.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* 2011.11.30 වැනි දින අයිලන්ඩ්, ලක්බිම හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු කොමර්ෂල් බැන්ක් පී එල් සී, අංක 49/57, මාතලේ පාර, ගලේවෙල.

දුරකථන අංක : 066-2287237, 066-2287238, 066-2289351.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 071-4755974, 071-8446374, 077-7761706.
දුරකථන/ෆැක්ස් අංකය : 081-2210595.

05-69

---

**මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව**

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම**

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2013.05.21 දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය* .- ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පෙපත්තුවේ මීපේ හප්පාවල පිහිටි, දූගොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සිරිවර්ධන විසින් 1999.05.19 දින මැන සාදන ලද අංක 185/1999 පිඹුර පරිදි බෙදා වෙන් කළ අංක 01 දරන පර්චස් දහයයි දශම එකයි එකක් (අ. 0 රූ. 0 පර්. 10.11) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

ඉහත කී දූවගොඩවත්තේ අංක 15 දරන රෑඩ් දෙකයි පර්චස් දාහතරයි දශම දෙකයි හතරක් (අ. 0 රූ. 2 පර්. 14.24) විශාල ඉඩම සියලු කටයුතු සඳහා භාවිතා කිරීමේ මාර්ග පරවශතා අයිතිය ද සමග වේ.

වැඩි විස්තර සඳහා 2010.05.02 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2012.02.02 දින, "දිනමිණ" ඩේලි නිවුස් හා තිනකරන් යන පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීමේ මාර්ගය* .- ගාල්ල - අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ පිලාන හන්දිය දක්වා පැමිණ එතැනින් දකුණට හැරී හප්පාවල මාර්ගයේ මීටර් 200ක් පමණ ගමන් ගත් විට රන්මුතු උයන පාර හමුවේ. රන්මුතු උයන පාරේ මීටර් 75ක් පමණ ගමන් ගත් විට පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇති. රන්මුතු උයන නමින් හඳුන්වන නිවාස යෝජනා ක්‍රමයේ අංක 01 දරන දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ගාල්ල පහල ඩික්සන් පාරේ අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතු ය .

දුරකථන අංක : 091-2232311, 2234785, 2234171 හා 2223564,
ෆැක්ස් අංකය : 091- 2232230.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516.

05-65

**සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බෑන්කිං යුනිට් ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කොළඹ 05 පදිංචි කැමිලා සුසන්ති ජෝර්ජෙන්සන් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ කදාන උප කාර්යාල සීමාව තුළ දකුණු බටගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2003.03.21 වැනි දිනැති අංක 2069 දරන සැලැස්මේ නිරූපනය වන ද මැසනඩ් විද්‍යාලය පාර වරිපනම් අංක 1103 (කොටසක්) දරන මිල්ලගහවත්ත හෙවත් පතන්ගිගහවත්ත නමැති ඉඩමේ ලොට් පී ලකුණු කළ බෙදාවෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2069 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 9.50) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ කදාන උප කාර්යාල සභා සීමාව තුළ දකුණු බටගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1976.08.05 දිනැති අංක 3772 දරන සැලැස්මේ නිරූපනය වන මිල්ලගහවත්ත හෙවත් පතන්ගිගහවත්ත නමැති ඉඩමේ ලොට් 7 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන්කිරීම) බෙදාවෙන් කරනලද ඉඩම් කොටස එකී අංක 3772 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 7.5) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2013 මැයි මස 28 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කදාන නගර මධ්‍යයේ සිට ගනේමුල්ල පාරේ කි. මී. 1ක් පමණ ගිය විට ඇති ද මැසනඩ් විද්‍යාලය දක්වා පැමිණ වම්පසට ඇති ද මැසනඩ් පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 300ක් පමණ ගොස් දකුණු පසට ඇති ද මැසනඩ් පාසල් පටුමග හැරී මඳ දුරක් ගිය විට මාර්ගයේ වම්පස අදාළ දේපළ පිහිටා ඇති.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2013.01.24 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2012.12.17 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2013.01.07 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකාරිනිය, (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456475, 2456473.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 2572940.

05-61

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. කේ. එම්. නිශාන්ත සහ ඩබ්ලිව්. ඒ. පී. අයිරාංගනී.
ගිණුම් අංක 1004 5316 6016.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබිඇති බලතල ප්‍රකාර 2008ක් වූ අප්‍රේල් මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 3052 ප්‍රකාර රුපියල් අසූ හය ලක්ෂ තිස් දෙදහස් හත්සිය පනස් හයයි ශත දහයක (රු. 8,632, 756.10) මුදලක් 2008 ජනවාරි 29 වැනි දින සිට බැඳුම්කර අංක 3052 මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ ලක්ෂ හතළිස් දහස් තුන්සිය අනූ දෙකයි ශත පනස් එකක (රු. 8,040,392.51) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2009.09.07 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.05.22 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ අඹතලෙන් පහල කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කොහිලවත්තේ පිහිටි "මුරුත්ගහකුඹුර සහ ඕවිට, මුරුත්ගහඕවිටවත්ත, වත්තලිගේවත්ත සහ සුදුවේකුඹුර" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සාලිය වික්‍රමසිංහ යන අය විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 24 දාතම හා අංක 6410 ඒ දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට

සීමා නිර්ණයකොට ලොට් එක්ස් වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 1797 සී ලොට් ඒ හි ඉතිරි කොටස නැගෙනහිරට : පාර සහ පිඹුරු අංක 1797 හි ලොට් ඒ හි ඉතිරි කොටස දකුණට : පිඹුරු අංක 1797 හි ලොට් ඒ හි ඉතිරි කොටස සහ බස්නාහිරට : පිඹුරු අංක 1797 හි ලොට් ඒ හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0 රූ. 1 පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 6410 ඒ අනුව වෙළුම/පත්‍රිරුව බී 893/187 හි කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-71

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ජූඩ් නිමල් සිල්වා තෝමස් පුල්ලේ සහ තෝල්කගේ ක්‍රිස්ටීන් නිශාමනී සොයිසා කාඩොස් සහ එන් එස් සී ට්‍රේඩින් කොම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්

ගිණුම් අංක : 1076 5314 7396 සහ 0076 1000 0066

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබීඇති බලතල ප්‍රකාර 2012.08.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි විසි පන් ලක්ෂ අට දහස් නවසිය හැත්තෑ තුනයි ශත අනූ අටක (රු. 12,508,973.98) මුදල ද, 2010 මාර්තු මස 25 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට පන් ලක්ෂ අසූහතර දහසක (රු. 6,584,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියක් දශ ලක්ෂයක (1,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2012.11.02 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2012.10.19 වැනි දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.05.21 දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කඳාන උප කාර්යාල ප්‍රදේශ තුළ කඳානේ පිහිටි කොළඹ පාර වරිපනම් අංක 65/5 දරන "මිල්ලගහවත්ත සහ මිල්ලගහහේනවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩී. ජේ. වි පෙරේරා යන අය විසින් සාදන ලද 1996 අගෝස්තු මස 23 දාතම හා අංක 15095 ඒ දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් හි පරිශ්‍රයන් සහ ඩග්ලස් දබරේරාගේ ලොට් 3 ඒ, නැගෙනහිරට : ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් හි පරිශ්‍රයන් සහ කලින් වැරියට් පෙරේරාගේ දැන් ගාමිණී පෙරේරාගේ ඉඩම, දකුණට : අඩි 8 පළල පාර සහ බස්නාහිරට : රංජිත් රුදිගු ගේ ලොට් 2 ඒ 1, ඩග්ලස් දබරේරාගේ ලොට් 3 ඒ සහ බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද අංක 220 ඒ දරන පිඹුරේ අඩි 10 පළල පාර (ලොට් 5) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම එකයි පහක් (අ. 0 රූ. 0 පර්. 35.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 15095 ඒ දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව බී 556/261 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව බී 578/196 යටතේ ලියාපදිංචි කොට ඇති බලයලත් මානක තැන එච්. ඩී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1990 මැයි 20 දාතම හා අංක 220 ඒ දරන පිඹුරේ නිරූපිත ලොට් 5 (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම)

ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව බී 579/1972 යටතේ ලියාපදිංචි කොට ඇති බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා යන අය විසින් සාදන ලද 1996 ජූලි 30 දාතම හා අංක 3255 දරන පිඹුරේ නිරූපිත පාර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-70

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිළ දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2013** | | | | | |
| මැයි | 2013.05.03 | සිකුරාදා | 2013.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.10 | සිකුරාදා | 2013.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.17 | සිකුරාදා | 2013.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.23 | බ්‍රහස්පතින්දා | 2013.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.31 | සිකුරාදා | 2013.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2013.06.07 | සිකුරාදා | 2013.05.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.06.14 | සිකුරාදා | 2013.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.21 | සිකුරාදා | 2013.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.28 | සිකුරාදා | 2013.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.